# ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
## ප්‍රධාන කාර්යාලය
## ඇබෑර්තු

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස, ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | ශ්‍රේණිය | වැටුප |
|---|---|---|---|
| 01. | වීඩියෝ කැමරා ශිල්පී | බී 3 | රු.73875-5x845-10x950-87600 |
| 02. | නිශ්චල ඡායාරූප ශිල්පී | බී 3 | රු.73875-5x845-10x950-87600 |

**පත්වීමේ ස්වභාවය** - ස්ථිර පදනම

**ඉහත තනතුරු වලට අවශ්‍ය සුදුසුකම්**

1 අ.පො.ස. (උ.පෙළ ) විභාගයෙන් විෂයයන් 02 ක සාමාර්ථය සමඟ අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු 04 ක පළපුරුද්දක් තිබිය යුතුය.

නැතහොත්,

2. අ.පො.ස. (සා.පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් හයක් (06) සමත් වී තිබීම හෝ ඒ හා සමාන අන් සුදුසුකමක් සමඟ අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු අටක (08) පළපුරුද්දක් තිබිය යුතුය.

3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි.

4 ලිඛිත/ වෘත්තීය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

**01. බී 3 ශ්‍රේණියේ, වීඩියෝ කැමරා ශිල්පී තනතුරට අදාළ කාර්ය ක්ෂේත්‍රය**

1. අංකික වීඩියෝ කැමරා භාවිතයෙන්, එහි මූලික නඩත්තු හා මනා ක්‍රියාකාරීත්වය පිළිබඳ වග බලා ගැනීම හා එය භාවිතයේ වෘත්තීය මට්ටමේ වීඩියෝ පටිගත කිරීම.
2. අංකික වීඩියෝ නිෂ්පාදන සම්බන්ධව වීඩියෝ කැමරා ත්‍රිපාද, කැමරා කාච, ඒ.සී. අඩප්ටරස්. වීඩියෝ රැහැන් ආදියෙහි මනා ක්‍රියාකාරීත්වය හා පැවැත්ම පිළිබඳ වගබලා ගැනීම.
3. අදාළ වීඩියෝ පිටපත් වෘත්තීය මට්ටමෙන් ගබඩා කර තබා ගැනීම හා වීඩියෝ පසු නිෂ්පාදන කටයුතු පිළිබඳ වගකීම දැරීම අමතර විශේෂ කාර්යයන් ලෙස සලකනු ලැබේ.

**සැ.යු. - පහත සඳහන් කරුණු පිළිබඳව ඇති අවබෝධය සහ අමතර සුදුසුකම් පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.**

1. පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය සම්බන්ධයෙන් ලබාගත් මාස (06) කට නොඅඩු න්‍යායික හා ප්‍රායෝගික අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා හෝ වෘත්තීය මට්ටමේ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
2. රූපවාහිනී / චිත්‍රපට මාධ්‍යයන්ට සම්බන්ධ පිළිගත් ආයතනයක සාමාජිකත්වය ලබා තිබීම.
3. අංකික වීඩියෝ තැටි වර්ග වන DV, DV cam Pro, පරිගණක චිප් (chip) ආදිය පිළිබඳ අවබෝධය හා ඒවායේ සුවිශේෂතා පිළිබඳ අවබෝධය.
4. වීඩියෝ ආලෝකකරණ හා ඒ ආශ්‍රිත අලෝකකරණ උපකරණ පිළිබඳ මනා අවබෝධයක් තිබීම.

5. රූපවාහිනී / චිත්‍රපට මාධ්‍යයෙහි පසු නිෂ්පාදන කටයුතු වල වෘත්තීය මට්ටමේ අත්දැකීම් සහිත වීම.

6. වීඩියෝ රූප රාමු වර්ග, රූපවාහිනී තාක්ෂණික පිටපත් කියවා ඒ අනුව ස්වාධීනව අංකිත වීඩියෝ කැමරා මෙහෙයවීමේ හැකියාව.

7. අවශ්‍ය අවස්ථාවන්හිදී ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

8. සාමූහික/ කණ්ඩායම් වැඩ කිරීමේ හැකියාව.

**02.** <u>බී 3 ශ්‍රේණියේ, නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරට අදාළ කාර්ය ක්ෂේත්‍රය</u>

1. අංකිත නිශ්චල කැමරා භාවිතා කිරීම හා මූලික නඩත්තුව පිළිබඳ අවබෝධයක් තිබීම සහ අංකිත නිශ්චල කැමරා භාවිතයෙන් වෘත්තීය මට්ටමේ ඡායාරූප ගැනීම.

2. අංකිත කැමරා කාලීනව නඩත්තු කිරීම හා පැවැත්ම ආරක්ෂා කර ගැනීම සහ ඊට අදාළ කැමරා කාච, කැමරා බැටරි ඇඩප්ටර්ස්, කැමරා ත්‍රිපාද ආදී කැමරා උපකරණ පිළිබඳ අවබෝධය හා ඒවායේ මනා පැවැත්ම ආරක්ෂා කර ගැනීම.

3. සංස්ථාව හා සම්බන්ධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ආයතන හෝ බාහිර ආයතන සම්බන්ධ නිශ්චල ඡායාරූප ගැනීම හා එම ඡායාරූප සංස්කරණය, මුද්‍රණය අදාළ CD තැටි ගබඩා කිරීම සම්බන්ධ සියලු කාර්යයන් කිරීම.

4. සංස්කරණය කරනු ලැබූ ඡායාරූප සහිත ( Corporate Album) සැකසීම හා ඊට අදාළ කටයුතු වෘත්තීය මට්ටමින් ඉටුකිරීම.

සැ.යු. - පහත සඳහන් කරුණු පිළිබඳව ඇති අවබෝධය සහ අමතර සුදුසුකම් පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

1. අංකිත නිශ්චල ඡායාරූප හා ආශ්‍රිත පරිගණක භාවිතා කිරීමේ හැකියාව විශේෂයෙන් Photoshop මෘදුකාංගය භාවිතා කිරීමේ හැකියාව.

2. පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් රූපවාහිනී හෝ ගුවන් විදුලි මාධ්‍ය සම්බන්ධයෙන් හෝ ඡායාරූපකරණ පිළිබඳ ලබාගත් මාස 06 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා හෝ වෘත්තීය මට්ටමේ සහතික පත් පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

3. ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමේ හැකියාව.

4. සාමූහික/ කණ්ඩායම් වැඩ කිරීමේ හැකියාව.

<u>අමතර ප්‍රතිලාභ</u>

සංස්ථාවේ වෛද්‍යාධාර ක්‍රමය යටතේ සාත්තු නිවාස පහසුකම් ඇතුලුව නොමිලයේ වෛද්‍යාධාර පහසුකම්, නිවාස ණය පහසුකම්, වාහන ණය පහසුකම් යනාදිය හිමිවනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල් සාමාජිකත්වය සඳහා සේවකයා තම වැටුපෙන් 10% ක ප්‍රමාණයකින් දායක විය යුතු අතර, ඒ සඳහා සංස්ථාවෙන් 15% ක ප්‍රමාණයක් ගෙවනු ලැබේ. සේවා නියුක්තයන්ගේ භාර අරමුදල වෙනුවෙන් වැටුපෙන් 3% ක ප්‍රමාණයක් සංස්ථාවෙන් ගෙවනු ලැබේ.

වෙනත් - සියළුම බඳවා ගැනීම් සඳහා සංස්ථාවේ කාර්යය සංවිධාන සංග්‍රහයේ හා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා පණතේ නියමයන් බල පැවැත්වේ.

<u>අයදුම්කිරීමේ පිළිවෙල</u>

රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානියා මගින් යොමු කළ යුතු අතර, මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් අයදුම්කරු තම ආයතනයෙන් මුදා හැරීමට හැකියාව ඇති බව සඳහන් කළ යුතුය.

ඔබගේ අයදුම්පත්‍රය සමඟ අධ්‍යාපන සහතිකවල පිටපත් ග්‍රාම නිලධාරී හෝ සාමදාන විනිශ්චයකාරවරයෙකු විසින් මුල් පිටපත සමඟ සසඳා සත්‍ය පිටපත් බවට සහතික කොට අමුණා එවිය යුතුය. ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව විස්තරාත්මක අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු වේ.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කර 2021.07.20 දිනට හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

*මෙම තනතුරු වලට අදාළව **2019.03.19** දින නකුත් කරන ලද බාහිර ඇබෑර්තු නිවේදනය මින් අවලංගු වේ.*

සටහන : රටේ පවත්නා තත්වය හේතුවෙන් අයදුම්පත් ලැබීම ප්‍රමාද විය හැකි බැවින්, **තැපැල් කිරීමට අපේක්ෂිත අයදුම්පතේ ස්කෑන් කරන ලද පිටපතක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට හෝ ඊට පෙර පහත සඳහන් විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.**

<u>vacancies@ceypetco.gov.lk</u>

කළමනාකාර අධ්‍යක්ෂ
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව.
අංක.609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09.

2021.06.29 දින,
යු/ඩීපී